www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# තෙල් සඳහා වූ පොරයට ඉන්දියාව එකතු වෙයි

## India joins the scramble for oil

**පාර්විනි සෝරා සහ ඩැනියෙල් වොරෙක් විසිනි**

**2005 අප්‍රේල් 12**

*''ආසියාවේ අපි කිසිවෙක් පිටස්තරයින්ගේ මූලෝපායන්ට ගොදුරු නො විය යුතු ය. අනෙකුන්ගේ භූ දේශපාලනයට එදිරි වීමට ඇති එකම මාවත නම් අපේ ම වූ භූ දේශපාලනයක් ගොඩ නගා ගැනීම යි.''*

-- ඉන්දියාවේ ඛනිජතෙල් සහ ස්වාභාවික ගෑස් පිලිබඳ ඇමති, මනිසන්කර් අයියර්

චීනය, දකුනු කොරියාව, ජපානය ඇතුලු අනෙකුත් ආසියාතික රාජ්‍යයන් සමග තෙල් සහ ස්වාභාවික ගෑස් සඳහා වූ භූගෝලීය සටනකට ඉන්දියාව මෑතක දී සම්බන්ධව සිටියි. අන්තර්ජාතික නල මාර්ග සහ විදේශීය බොර තෙල් සහ ස්වාභාවික ගෑස් නිෂ්පාදන ගනු දෙනු ආරක්ෂා කිරීමට ඉලක්ක කරන ලද රාජ්‍යතාන්ත්‍රික උපායන් තුලින් ලෝකයේ බලශක්ති සම්පත්වල සුවිශාල පංගුවකට අයිතිවාසිකම් කියා පෑමට ඉන්දියාව උත්සාහ දරමින් සිටියි. ජාතික බලශක්ති කර්මාන්තයේ දැවැන්ත ප්‍රතිව්‍යුහගත කිරීමක් ද ඉන්දියාව සිදු කරමින් සිටී.

තෙල් සඳහා ඉන්දියාවේ පිපාසය ආර්ථික අවශ්‍යතාවන් තුල මුල් බැස ඇත්තේ වී නමුදු විදේශ බලශක්ති ව්‍යාපාරයේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස ඉන්දියාවේ මතු වීම ලෝක භූදේශපාලනය මත බලගතු බලපෑමක් ඇති කරනු ඇත. එය සිදුවන්නේ, තෙල් දූනටමත් එක්සත් ජනපදය, යුරෝපා සංගමය, චීනය, ජපානය සහ රුසියාව අතර වඩාත් තීව්‍ර තරගයේ විෂය බවට පත් වී ඇති කොන්දේසි තුල ය.

රටේ ජාත්‍යන්තර ඉන්ධන පිලිවෙත ඇමරිකා එක්සත් ජනපදය සමග ගැටුමක් කරා වර්ධනය වෙමින් ඇත. විශේෂයෙන් ම ඉරානයේ සිට පකිස්ථානය හරහා ඉන්දියාව දක්වා ඉදිකෙරෙන නල මාර්ගය සම්බන්ධව ඉන්දියාව ඉරානය සමග ඇති කර ගන්නා එකඟතා ව්‍යර්ථ කර දැමීමට ඇමරිකා එක්සත් ජනපදය තීන්දුවකට එලඹ සිටී. ඉන්දියාව, චීනය සහ රුසියාව අතර සමීප සබඳතාවයන් වර්ධනය වීම මෙන්ම තෙල් සම්පත් බහුල වෙනිසියුලාව සමග ගොඩ නැගෙන ඉන්දියාවේ මිත්‍රශීලී සම්බන්ධතා ඇමරිකා එක්සත් ජනපදයේ උවමනාවන්ට බලගතු තර්ජනයකි.

බලශක්ති අවශ්‍යතා සහ බලශක්ති සැපයුම මත පාලනය තබා ගැනීම සියලු ම මහා බලවතුන්ගේ මූලෝපායාත්මක ගනන් බැලීම්වලට කේන්ද්‍රීය කාරනාවකි. 1991 දී එහි පශ්චාත් ස්වාධීන ජාතික සංවර්ධන පිලිවෙත අතහැර, ඉන්දියාව, භූගෝලීය නිෂ්පාදනයේ, කාර්යාල සත්තතියේ සහ පර්යේෂන නිෂ්පාදනයේ වේදිකාවක් බවට පරිවර්තනය කිරීමට ද මහ බලවතකුගේ තත්වය තහවුරු කර ගැනීම ලෝක ධනේශ්වර ආර්ථිකය තුල වඩ වඩා වැඩිවන එහි බර සහ න්‍යශ්ටික, අභ්‍යවකාශ සහ මිලිටරි ධාරිතාවයන් යොදා ගැනීමට උත්සාහ කරමින් සිටින ඉන්දියානු ධනේශ්වරයට නො වැදගත් නො වේ.

භූගෝලීය තෙල් පරිභෝජනය තුල ඉන්දියාව ඉටු කරන්නේ තවමත් සුලු ක්‍රියා කලාපයකි. ලෝක ජනගහනයෙන් සියයට 15ට වැඩි ප්‍රමානයක් ඉන්දියාවේ ජීවත් වන නමුත් එය පරිභෝජනය කරන්නේ ලෝක තෙල් පරිභෝජනයෙන් සියයට තුනක් පමනි. ඊට ප්‍රතිවිරුද්ධ චීනය ලෝක තෙල් නිෂ්පාදනයෙන් සියයට 7.6ක් පරිභෝජනය කරයි. කෙසේ වෙතත් ඉන්දීය බලශක්ති අවශ්‍යතාවය තියුනු ලෙස ඉහල නැගෙමින් ඇත. පසු ගිය වර්ෂයේ පමනක් ඉන්දියාවේ බොර තෙල් පරිභෝජනය සියයට 10කින් වැඩි වී තිබේ. එපමනක් නොව, ආනයනිත තෙල් මත ඉන්දියාව බෙහෙවින් ම යැපෙයි. ඉන්දියාව තෙල් සියයට 70ක් ආනයනය කරයි. එසේ ම ඉන්දියාවේ සමස්ථ ආනයන වටිනාකම්වලින් 1/3ක් තෙල් සඳහා වැය කරයි. 2020 වන විට දී බලශක්ති අවශ්‍යතාවන්ගෙන් සියයට 80ක් ආනයනය කිරීමට සිදු වනු ඇතැයි ඉන්දියාව අපේක්ෂා කරයි.

තෙල් පරිභෝජනයට සහ ආනයනයට තල්ලුව සපයන ලෝකයේ වේගයෙන්ම වර්ධනය වන කාර් රථ වෙලඳ පොල ඉන්දියාව සතුව ඇත. ආර්ථික වර්ධනය, වැඩි වන තෙල් මිල සහ ඉරාකය සහ ඇෆ්ඝනිස්ථානය තුලට එක්සත් ජනපද මිලිටරි මැදිහත් වීම නිසා තෙල් සැපයුමේ මෑත දී ඇති පහත වැටීම ලාභ තෙල් සහ ස්වාභාවික ගෑස් පිලිබඳ ආරක්ෂිත ප්‍රභවයන් සෙවීමේ දඩයමට සම්බන්ධ වීමට ඉන්දියාවට බල කෙරෙමින් ඇත.

එහි තෙල් සහ ස්වාභාවික ගෑස් සම්පත් ආරක්ෂා කිරීමේ සහ විවිධාංගකරනය කිරීමේ ඉන්දියාවේ වර්තමාන ධාවනයේ හදිසිභාවයට බෙහෙවින් ම තුඩු දී ඇත්තේ සෙසු රටවල්වලට විශේෂයෙන් ම චීනයට පිටුපසින් වැඩීම පිලිබඳ භීතිය යි.

තෙල් සඳහා තරගයේ දී ඉන්දුනීසියාව සහ සුඩානයේ දී චීනයට පරාජය වීම ගැන ඉන්දියාව සැලකිලිමත් වූ බව පාර්ශ්වීය වසයෙන් පුද්ගලීකරනය කරනු ලැබ ඇති තෙල් සහ ස්වාභාවික ගෑස් සමාගමේ සභාපති සුබීර් රිහා බිලුම්බර් ඩොට් කොම් සමග මෑත දී පැවති සම්මුඛ සාකච්ඡාවක දී පැවසී ය.

විදේශ බලශක්ති සම්පත් ඩැහැ ගැනීමට උත්සාහ කරමින් ''පසු ගිය වසර තුන හතර තුල'' ඉන්දියාව මත චීනය ප්‍රහාරාත්මක ''ඉදිරි පිම්මක්'' ගෙන ඇත. බොර තෙල් මිල ''තනි සංඛ්‍යාවකට පහත වැටුන'' විට චීනය ''බොහොමයක් තෙල් සහ ගෑස් ව්‍යාපෘති'' අල්ලා ගත්තේ යයි රිහා පැමිනිලි කලේ ය. ''අප ජාත්‍යන්තර වෙලඳ පොලට එන විට බොර තෙල් වාර්තාගත මට්ටමට නැග තිබුන අතර කිසිවෙකුත් දේපල නො විකුනුවේ ය''යි ඔහු තව දුරටත් පැවසී ය.

නමුත් ලෝක තෙල් සැපයුම් පාලනය කිරීම සඳහා වූ එක්සත් ජනපද පෙලඹුම වඩාත් බරවන උත්සුකතාවකි. ඇෆ්ඝනිස්ථානය, ඉරාකය ආක්‍රමනය කිරීම තුලින් මැද පෙරදිගට සහ මධ්‍යම ආසියාවට සිය මිලිටරි බලය විහිදුවා හරිමින් එක්සත් ජනපදය ලෝක තෙල් සැපයුම මත ග්‍රහනය තද කර තබා ගැනීමට උත්සාහ කරන බව සහ මෙය ඉන්දියානු ධනපති පන්තියේ උවමනාවන්ට බලගතු තර්ජනයක් බවත් නව දිල්ලිය හොඳින් හඳුනයි.

සීතල යුද්ධය අවසන් වීම සහ ජාතික ආර්ථික නියාමය අතහැරීමෙන් පසු, ඉන්දියානු ආන්ඩුව වොෂින්ටනය සමග නව සම්බන්ධතාවක්, ඉන්දියානු-එක්සත් ජනපද මූලෝපායාත්මක සන්ධානයක් වර්ධනය කර ගෙන ඇත. ඇමරිකා එක්සත් ජනපදය වර්තමානයේ ඉන්දියාවේ සුවිශාලතම වෙලඳ හවුල්කරුවා වෙයි. සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් පසුව ඇති කර ගත් ද්විපාර්ශ්වික ආරක්ෂක ගිවිසුමට අනුව, ඉන්දීය සහ එක්සත් ජනපද හමුදාවෝ ඉන්දියානු සාගරය සහ දකුනු චීන මුහුදේ ඒකාබද්ධ යුද අභ්‍යාසවල යෙදී ඇත.

මෙම බැඳීම් තිබියදී ම, බලශක්ති සම්පත් ආරක්ෂා කිරීමට ඉන්දියාවේ හදිසි අවශ්‍යතාවය ඉන්දීය එක්සත් ජනපද සම්බන්ධතාවය තුල දෘවැන්ත කුස්තුර නිර්මානය කිරීමට දායකත්වය සපයමින් සිටියි. එමෙන් ම එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය ආක්‍රමනය කිරීමෙන් පසුව, එක්සත් ජනපදයේ බලය සීමා කිරීමේ බලාපොරොත්තුව ඇතිව චීනය, රුසියාව, ඉරානය, ඇතුලු ආසියානු රටවල් සමග සම්බන්ධතාවයන් වර්ධනය කර ගැනීමට ඉන්දියාව ඉස්මත්තට යාමේ හදිසිභාවය මෙමගින් තව දුරටත් නිර්මානය කෙරුනි.

ඉන්දියාව සහ චීනය අතර ආර්ථික සහ භූ-මූලෝපායාත්මක ගැටුම් තීව්‍ර වී තිබේ. කෙසේ වෙතත්, කලින් පැවති භාරතීය ජනතා පක්ෂය (බීජේපී) මෙහෙයවන ලද රජය, ආරම්භ කල පියවරයන් පෙරට ගෙන යමින් වර්තමාන කොංග්‍රසය මෙහෙයවන එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) රජය චීනය සමග සබඳතා ගොඩනගා ගැනීමට උත්සාහ කරමින් සිටියි. අනාගතයේ දී එක්සත් ජනපදය සහ චීනය අතර සිදුවිය හැකි කවර හෝ ගැටුමක දී ඉන්දියාව ඉදිරි පෙල රාජ්‍යයක් ලෙස තබා ගැනීමේ වොෂින්ටනයේ එල්ලයන් ගැන ඉන්දියාව පරීක්ෂා කාරී වෙයි. බලශක්ති සම්පත් සඳහා චීනය සමග ඍජු ගැටුමක් මග හැර සිටීමට ද එය වඩ වඩා උනන්දු සහගත වෙයි. රුසියාව, ඉරානය, සහ සුඩානයේ ඇතුලට, තෙල් කැනීමේ ඒකාබද්ධ ව්‍යාපාර රටවල් දෙකක් විසින් පවත්වා ගෙන යන අතර චීනය තව තවත් වැඩි සමීප සහයෝගිතාවක් යෝජනා කර ඇත.

මේ මෑත මාරුවීම ප්‍රතිබිම්බනය කරමින් ඉන්දීය අග්‍රාමාත්‍ය මන්මෝහන් සිං මෑත දී මෙසේ ප්‍රකාශ කලේ ය. ''රාජ්‍ය තාන්ත්‍රික කටයුතු වෙනස් වී තිබේ. අද එය ආර්ථික විද්‍යාව, වෙලඳාම සහ ඛනිජතෙල් සම්බන්ධයෙනි.'' එම වචන ම චීන නියෝජ්‍ය විදේශ අමාත්‍ය ෂාවෝ වෙන් ෂෝන්ග් ප්‍රතිරාවය කලේ ය. ''ව්‍යාපාර යනු ව්‍යාපාරයි. ව්‍යාපාරවලින් දේශපාලනය වෙන් කර ගැනීමට අපි වෙර දරමු.''

එක්සත් ජනපදය ආසියාව තුලට විනිවිදීම දමනය කරගැනීමේ අරමුනින් නො නිල ඉන්දු චීන රුසියා සන්ධානයක් ගැන සමහර සාකච්ඡා සිදු කෙරී ඇත. ''ඉන්දියාව සහ චීනය එක්ව ලෝක පර්යාය යලි හැඩ ගැන්විය හැකියැයි'' ෂිං ගේ ප්‍රකාශයත් සමග ''මූලෝපායාත්මක සන්ධානයක්'' ගොඩනගා ගැනීම ඉන්දියාව සහ චීනය අප්‍රේල් 11 නිවේදනය කලේ ය. ද්විපාර්ශ්වීය වෙලඳාම ඉහල නැංවීම, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා වැඩි දියුනු කිරීම සහ ''ගෝලීය අභියෝග සහ තර්ජනයන්'' ආමන්ත්‍රනය කිරීම සඳහා ඒකාබද්ධව වැඩ කිරීමේ පොරොන්දු ගිවිසුමට ඇතුලත් ය.

## රුසියාව සමග බලශක්ති ආරක්ෂක ගිවිසුම

පසු ගිය වසරේ රුසියානු ජනාධිපති ඉන්දියාවට කල සංචාරයෙන් පසු කැස්පියන් මුහුදේ ස්වාභාවික ගෑස් ගවේෂනය සහ බෙදා හැරීම මෙන් ම භූගත ගෑස් ගබඩා පහසුකම් ඉන්දියාව තුල ගොඩනැගීමේ සහ රුසියාවෙන් තාක්ෂනය ඉන්දියාවට ලබා දීමේ දෙරට අතර අවබෝධාත්මක ගිවිසුමක් අත්සන් කලේ ය.

පසු ගිය ඔක්තෝබරයේ දී මොස්කව්හි සංචාරයක යෙදෙමින් සිටිය දී ඉන්දියාවේ ඛනිජතෙල් හා

ස්වාභාවික ගෑස් පිබඳ අමාත්‍ය මන්මෝහන් අයියර් මෙසේ ප්‍රකාශ කලේ ය. ''ඉන්දීය නිදහසෙන් පසු ගත වූ අඩ සියවස තුල රුසියාව අපගේ භෞමික අඛන්ඩතාව සහතික කර ඇත.

''එසේම දෙවන අර්ධයේ දී අපගේ බලශක්ති ආරක්ෂනය තහවුරු කිරීමට එයට හැකි වනු ඇත. ජාතික ආරක්ෂාව තරමට ම, ඉන්දියාවට බලශක්ති ආරක්ෂාව වැදගත් කමක් අත්කර ගනිමින් පවත්නා තතු තුල මා මේ කථා කරමින් සිටින්නේ රුසියාව සමග මූලෝපායාත්මක සන්ධානයක් ඇති කර ගැනීම ගැන ය.''

රුසියාවේ බලශක්තිවලින් සරු ෂැක්හෝලින්-බ්ලොක් 1 හි සියයට 20ක ආයෝජනයක් ඉන්දියාව මේ වන විටත් දරා සිටියි. ඉන්දියාවේ සීමාසහිත තෙල් සහ ස්වාභාවික ගෑස් සංස්ථාවේ (ඕඑන්ජීසී) විදේශ අංශය වන ඕඑන්ජීසී විදේශ් ලිමිටඩ් (ඕවීඑල්), ඩොලර් බිලියන 1.7 ආයෝජනයක් කර තිබේ. මෙම වසර අග දී එය ඩොලර් බිලියන 3.5 දක්වා ඉහල යාමක් බලාපොරොත්තු වෙයි.

කැස්පියන් මුහුදේ පිහිටි තෙල් කෙත් දෙකක් වන ෂැක්හෝලින්-3 සහ ඒකාබද්ධ රුසියානු-කසාක් කුර්මාන්ගෂී හි ඩොලර් බිලියන 1.5ක් බැගින් තව දුරටත් ආයෝජනය කිරීමට ඉන්දියාව සැලකිලිමත් වී ඇති බව වාර්තා වෙයි. එක්සත් ජනපදයේ සුවිසාල තෙල් සමාගම් දෙකක් ෂැක්හෝලින්-3 ව්‍යාපෘතියෙන් ඉවත් කිරීම මොස්කව් විසින් සිදු කිරීමෙන් පසු ටික කලකට පසුව එම ව්‍යාපෘතියට සම්බන්ධ වීමට ඉන්දියාවට කල ආරාධනාව සැලකිල්ලට ගත යුතු සිදු වීමකි.

සැලසුම් කර ඇති ඉන්දු-සිනෝ ඒකාබද්ධ ව්‍යාපාරයන්ගෙන් එකක් ලෙස රුසියාවේ පුටින් තන්ත්‍රය විසින් රජයට පවරා ගන්නා ලද රුසියානු යුකෝස් තෙල් සමාගමේ සමහර වත්කම් මිල දී ගැනීම හැකි වනු සඳහා ආසියානු පාරිභෝගිකයින් දෙස ඉන්දියානු සහ චීන තෙල් සමාගම් එකට පෙල ගැසී සිටිති.

මෙම පියවරයන්ගේ පැහැදිලි අරමුන වන්නේ, බලශක්ති නිෂ්පාදනය මත පවතින ඇමරිකානු අධිකාරයට කිසියම් වර්ගයක ප්‍රති බලයක් ලෙස තහවුරු වීම ය. ආරක්ෂක වලල්ලක් නිර්මානය කිරීම සඳහා ආසියානු ගෑස් නිෂ්පාදකයන් එකට ඒකාබද්ධ විය යුතු යැයි පෙබරවාරි 14 නව දිල්ලියේ පැවති ආසියානු ගෑස් මිල දී ගන්නන්ගේ සමුලුව ආරම්භ කරමින් ඉන්දියාවේ ඛනිජතෙල් ඇමති මනිසංකර් අයියර් ප්‍රකාශ කලේ ය. එවැනි ආරක්ෂක වලල්ලක එල්ලය වන්නේ තෙල් ලාබවල සම්පූර්න වාසිය ඩැහැ ගැනීමේ සහ බල ශක්ති ආරක්ෂාව සහ ආසියාවේ ආර්ථික වර්ධනය වලක්වනු ලබන ''කාලකන්නි බටහිර අධිකාරය'' එමගින් අවසන් කිරීමට කලාපය තුල රටවල්වලට හැකියාව ඇති කර ගැනීම ය.

## ඉරානය සහ පකිස්ථානය සමග තෙල් ගනුදෙනු සම්බන්ධ රාජ්‍ය තාන්ත්‍රික කටයුතු

ඉරානයේ සිට ඉන්දියාවට තෙල් සැපයීම සඳහා නල මාර්ගයක් ඉදිකිරීම ගැන කලින් පැවති බීජේපී ආන්ඩුවට ඉරානය විසින් කල යෝජනාව යලි වතාවක් සාකච්ඡාවට ඉදිරිපත් කෙරී ඇත. එක්සත් ජනපද ආර්ථික සම්බාධක සහ මිලිටරි ආක්‍රමනයක තර්ජනයකට ප්‍රතික්‍රියා කිරීම සඳහා ඉරානය ආසියානු බලයන් සමග රාජ්‍යතාන්ත්‍රික බැඳීම් ආරක්ෂා කර ගැනීමට හදිසි උනන්දුවක් පෙන්නුම් කරයි. ජාතික ඉරාන තෙල් සමාගම සමග (එන්අයිඕසී) ඩොලර් බිලියන 40ක ගිවිසුමක් අප්‍රේල් 7 කෙටුම්පත් කලේ ය. 2009 පටන් ගෙන වසර 25ක් ස්වාභාවික ගෑස් ආනයනය කිරීමට ගිවිසුම මගින් ඉන්දියාවට ඉඩ සලසා දෙයි. එන්අයිඕසී ය ද ඉරාන තෙල් නිධි දෙකක් සහ ගෑස් නිධියක් සංවර්ධනය කරනු ඇත.

එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් මෑත ඇගේ ඉන්දියානු සංචාරයේ දී මතු කල විරෝධතා ඇතුලුව, එක්සත් ජනපදයේ විරෝධතාවන් නිසා ඉරානය සමග ගනුදෙනු නතර නොකරන බව ඉන්දියානු ආන්ඩුව යලි තහවුරු කර තිබුනි. ''එක්සත් ජනපදයේ උත්සුකතාවන් කවරේ දැයි අපි සටහන් කර ගෙන ඇත්තෙමු. අපගේ බලශක්ති අවශ්‍යතාවන් කවරේ දැයි එක්සත් ජනපදය දැන සිටී. 2005 වන විට ස්වාභාවික ගෑස් ප්‍රමිති ඝන මීටර් මිලියන 100ක් අපට උවමනා ය. අපට එය සම්පාදනය කිරීමට ඇමරිකාවට හැකි ද? රටේ ආරක්ෂාව සඳහා බලශක්ති ආරක්ෂාව කෙරෙහි පමනයි මා බලන්නේ'' ඉන්දියානු කර්මාන්ත සම්මේලනය අවට සිටි වාර්තාකරුවන් අමතමින් අයියර් පැවසී ය.

ඛනිජතෙල් අපනය රටවල සංවිධානයට (ඔපෙක්) සම්බන්ධ රටවල් අතර විශාලතම බොර තෙල් නිෂ්පාදකයා ඉරානය යි. ලෝකයේ හඳුනාගත් තෙල් සම්පත්වලින් සියයට 10ක් එයට අයත් අතර ලෝකයේ දෙවන විශාලතම ගෑස් සම්පත් ද එයට හිමි ය. ඉරානය ස්වාභාවික සම්පත්වලට සහ මධ්‍යම ආසියාවේ සහ මැද පෙරදිග ආර්ථික අවස්ථාවන්ට අතගසා ගැනීම වලංගු කොරිඩෝරයක් ලෙස ඉන්දියාව සලකයි. පෙබරවාරි මාසයේ පැවති තෙල් ගැනුම්කරුවන්ගේ තුන්වන සමුලුව කාල පරිච්ඡේදයේ දී ජාතික ඉරාන ගෑස් අපනයන සමාගමේ (එන්අයිජීඊ) නිලධාරීන් ජූනි මාසය වන විට අත්සන් කිරීමට නියමිත ඉන්දු-පාකිස්ථාන දේශ සීමාවේ ඉදිකෙරෙන නල මාර්ගයක් හරහා ඉරාන ගෑස් බෙදා හැරීමට අදාල ගිවිසුම ගැන මූලික සාකච්ඡා ආරම්භ කලහ.

ඉන්දු-පාකිස්ථාන්-ඉරාන නල මාර්ගයක වර්ධනය එහි බලශක්ති උවමනාවන් සපුරා ගැනීමේ සහ පාකිස්ථානය සමග වඩා සමීප ආර්ථික සම්බන්ධතා ඇති කර ගැනීම යන දෙකටම ගැලපෙන මාධ්‍යයක් ලෙස නව දිල්ලිය විසින් දක ගනු ලබයි. ඉන්දියාව සමග භූ දේශපාලනික ගැටුමක් පාකිස්ථානයට ඇති හැකියාව දුර්වල කිරීමේ සහ ඉන්දියානු ව්‍යාපාරිකයන්ට පාකිස්ථාන වෙලඳ පොල මත අධිකාරය තබාගැනීමට හැකියාව මෙමගින් ඇති කරනු ඇතැයි ඉන්දියානු දේශපාලන ප්‍රභූහු ගනන් බලති.

කෙසේ නමුත් පාකිස්ථානය සමග සෘජු ගිවිසුමක් මගහැරීම සඳහා ඉන්දියාව වෙන් වෙන්ව යෝජනා දෙකක් ඉදිරිපත් කර ඇත. එකක් ගෑස් මිලට ගැනීම සඳහා ඉන්දියාව සහ ඉරානය අතරත් අනෙක නල මාර්ගය ඉදි කිරීම සඳහා ඉන්දියාව සහ පාකිස්ථානය අතරත් අත්සන් කිරීම, නල මාර්ගය දකුනු චීනය දක්වා දීර්ඝ කිරීමේ සැලසුම් ඇතුලත් කිරීමට සමුලුව පැවති කාලයේ දී ආරම්භක ඉදිකිරීමේ සැලැස්ම සංශෝධනය කලේ ය.

## ඉන්දියාව නැගෙනහිර ... සහ බටහිර බලයි

බුරුමයේ රන්ගුන්හි මිලිටරි ජුන්ටාව සම්බන්ධව නව දිල්ලිය විසින් කලින් අනුගමනය කල හුදකලාකිරීම්වාදී පිලිවෙත අතහරිමින්, පසු ගිය ඔක්තෝබර් මාසයේ බුරුම හමුදා නායක තාන් සුවේ වෙත සතියක සංචාරයකට ඉන්දියානු ආන්ඩුව අනුග්‍රහය සැපයී ය. බුරුමය සමගත් බංග්ලාදේශය හරහා ඉන්දියාවට බුරුමයේ ස්වාභාවික ගෑස් නල මාර්ගයක් මගින් ගෙන ඒමට මාවත පාදා ගැනීමේ කොටසක් ලෙස අසල්වැසි බංගලාදේශය සමගත් සමීප රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තීව්‍ර කර ගැනීම සංචාරයේ එල්ලය වුනේ ය. බුරුම නල මාර්ග ගිවිසුම කලාපීය සහයෝගිතාවේ දෑවැන්ත පියවරක් ලෙස ඉන්දියාවේ දී උත්කර්ශයට නංවා ඇත. විශේෂයෙන් ම එය ඉන්දු-බංග්ලාදේශ් සම්බන්ධතාවල වැදගත් සලකුනක් ලෙස දකිනු ලබයි. ඉන්දියානු ඛනිජතෙල් ඇමතිට අනුව එය ඉන්දියානු වෙලඳ පොලට කවර හෝ වෙලඳ භාන්ඩයක් ප්‍රවාහනය කිරීම සඳහා බංග්ලාදේශ දේශ සීමාව යොදා ගැනීමට වසර 30 ට පසුව බංගලා දේශය එකඟ වූ ප්‍රථම අවස්ථාව ය. ගිනිකොනදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය සහ බහු අංශික තාක්ෂනික සහ ආර්ථික සහයෝගිතාව සඳහා වූ බෙංගාල බොක්ක ආශ්‍රිත කලාපීය මූලිකත්වය සංවිධානය අතර වඩා සමීප කලාපීය සහයෝගිතාවය තුල ප්‍රධාන තැනක් ලබා ගැනීම සඳහා ඉන්දියාවේ මෑත ආරම්භකත්වය ගැනීම චීනය සහ ජපානය විසින් සම්ප්‍රදායිකව අධිකාරය තබාගෙන සිටි එහි නැගෙනහිර කලාපය විනිවිදීමේ නව දිල්ලි උත්සාහයේ කොටසකි.

ලිබියාව සුඩානය සහ අයිවරි කෝස්ට් ඇතුලුව අප්‍රිකාව සමග ගනුදෙනු මගින් බටහිරදී බලශක්ති අවශ්‍යතා රැකගැනීමට ඉන්දියාව සමත් වී තිබේ: දකුනු ඇමරිකානු රාජ්‍යයන් ගනනාවක් සමග දිගු කාලීන සම්බන්ධතා තහවුරු කර ගැනීමට ඉන්දියාව තව දුරටත් බලාපොරොත්තු වෙයි. මෙම රටවල් අතර වෙනිසියුලාව ප්‍රධාන තැනක සිටියි. ''ලතින් ඇමරිකාවේ දී වෙනිසියුලාව අපගේ හී තුඩ'' දකුනු ඇමරිකානු රටවල බලශක්ති වෙලඳ පොලට පිවිසීම සඳහා වෙනිසියුලාව යොදා ගත යුතු බව සඳහන් කරමින් ඉන්දියානු ඛනිජතෙල් ඇමති සහතික විය.

වෙනිසියුලාව සහ ඉන්දියාව අතර සමීප සබඳතා හියුගෝ චාවෙස්ගේ තන්ත්‍රය හුදකලා කිරීමේ එක්සත් ජනපද උත්සාහයන් සමග සෘජුව ම ගැටෙයි. වෙනිසියුලා ජනාධිපති හියුගෝ චාවෙස්ගේ සිව් දින සංචාරයේ දී ඔහු සහ ඉන්දියානු අගමැති මන්මෝහන් සිං බලශක්ති සහයෝගිතා ගිවිසුම් හයක් අත්සන් කලහ. සීමාසහිත ඕඑන්ජීසී සහ සීමා සහිත ජීඒඅයිඑල්, සාන් ක්‍රිස්ටෝබල් වෙනිසියුලියානු තෙල් නිධියෙන් සියයට 49 කොටස් ගැනීමට නියමිත අතර වෙනිසියුලා රජයට අයත් පීඩීවීඑස්ඒ තෙල් සමාගම් ඉන්දියාවේ කර්නාටක ප්‍රාන්ත රාජ්‍යයේ මැංගලෝර් තෙල් පිරිපහදුව තුල ආයෝජනය කරනු ඇත.

ලෝකයේ පස්වන විශාලතම තෙල් අපනයන කරන්නා වන වෙනිසියුලාව දැනට එහි තෙල්වලින් සියයට 60ක් මිලදී ගන්නා එක්සත් ජනපදය මත යැපීමෙන් නිදහස්වීමේ මාධ්‍යයක් ලෙස එහි වෙලඳ පොල විවිධාංගීකරනය කිරීමේ උත්සාහයක වර්තමානයේ යෙදී සිටියි. වෙනිසියුලාව මෑත දී රුසියාව, චීනය, බ්‍රසීලය සහ ආර්ජන්ටිනාව සමග සහයෝගය ගැඹුරු කල අතර ගිවිසුම් ගනනාවක් අත්සන් කලේ ය.

© www.wsws.org